# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2196/35 - 2020 ඔක්තෝබර් මස 07 වැනි බදාදා - 2020.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : ඩීවීඑන්/එල්එන්ඩී/02/ජීසීකිවුයූඅයි/05-II

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාවය ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 449ඒ, කඩවැද්දුව බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේ අපරැක්ක (හිඟුරුපත්තල) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2850 හා 2020.09.14 දිනැති සැලැස්මේ කැබලි අංක 01 සිට 05 දක්වා පෙන්නුම් කර ඇති මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0514 ක් වූ පහත දැක්වෙන ඉඩම් කොටස්:

**01. කැබලි අංක 01**
ඉඩමේ නම: බදුවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: රසික රංගන රාසපුත්‍ර, 'ශිල්පනී', හිඟුරුපත්තල, යටියන, මාතර (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0063.

**02. කැබලි අංක 02**
ඉඩමේ නම: බදුවත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සි. ඩී. ඒ. රාසපුත්‍ර, හිඟුරුපත්තල, යටියන (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0266.

**03. කැබලි අංක 03**
ඉඩමේ නම: බදුවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ළිඳක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සි. ඩී. ඒ. රාසපුත්‍ර, හිඟුරුපත්තල, යටියන, බදුවත්ත (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා); ප්‍රමාණය: හෙක්. 0.0010.

**04. කැබලි අංක 04**
ඉඩමේ නම: ඊශ්වරගෙ වත්ත; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: අරඹගේ කමල් තුෂාර, 'ඊශ්වරගේ වත්ත', හිඟුරුපත්තල, යටියන (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා. මු. පි. මාර 2724 හි කැබලි අංක 41 හි කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0136.




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

05. **කැබලි අංක 05**

ඉඩමේ නම: කල්දේරන් වත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ ළිඳක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කන්කානම්ගේ ගිමාරහාමි හෙවත් කන්කානම්ගේ විමලාවතී, අංක 295, 'මානෙල්', හිගුරුපත්තල, යටියන (ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ අත්කර ගන්නා ලදී. අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා. මු. පි. මාර 2724 හි කැබලි අංක 43 හි කොටසක්); ප්‍රමාණය: හෙක්. 0.0039.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.10.19 දින, පූ.භා. 10.00ට දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2020.10.12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. පී. ජී. සුමිත් ශාන්ත,
ප්‍රාදේශීය ලේකම් (වැ. බ.) හා
අත්කර ගැනීමේ නිලධාරී,
දෙවිනුවර

2020 සැප්තැම්බර් මස 28 වැනි දින
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
දෙවිනුවර.

10-547

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.